# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2014.05.29

**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වයඃ**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීමඃ

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

1. නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

බළන්ගොඩ නාමය ලොවට ගෙනගිය ආනන්ද මෛත්‍රීය මහානායක ස්වාමීන් වහන්සේගේ මෑණියන් තමන්ට පුතෙක් ලැබීමට භාරහාර වූ බෝගස වටා බෝධි ප්‍රාකාරයක් සෑදීමට අද දින මුල්ගල තැබූ බවත් එම ප්‍රාකාරය තැනීමට ඉඩම පරිත්‍යාග කළ එහි පාරම්පරික උරුමකරුවන් වූ නගර සභා ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මහතාට සහ එම පවුලේ සැමට ගරු සභාපතිතුමා විසින් ස්තුතිය පළකරන ලදි.

මේ වන විට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ විශාල අරමුදල් ප්‍රමාණයක් ලබාදී ඇති බවද ගරු මන්ත්‍රීතුමන්ලාගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඒවායේ ප්‍රතිලාභ ග්‍රාමසේවා වසම් 60 ක ජනතාවට ලබාදීමට කටයුතු කරන බවද ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. ග්‍රාමීය ජනතාව සමග එකතුව එම සත් කාර්යයන් කරගෙන යාමට ධෛර්යය ශක්තිය ලැබේවායි සුභ ප්‍රාර්ථනා එක් කරන බව ද ඉදිරි මැතිවරණ වලදී අතිගරු ජනාධිපතිතුමාට විශිෂ්ට ජයග්‍රහණයක් ලබාගැනීම සඳහා කටයුතු කරන ලෙස ද එතුමන් විසින් වැඩිදුරටත් දන්වා සිටින ලදි.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය සභාවාරයේ මහා සභාවට ලැබුණ ලිපි හා පැමිණිලි ඉදිරිපත් කිරීමේදී 06:02 යෝජනාව යටතේ පොදු වෙළඳසැල අංක 16 දරණ එළ හරක් මස් කඩය සඳහා තාවකාලික බලපත්‍ර ලබාගැනීමට එම්. ආර්. එම්. රියාස් මහතා විසින් කරන ලද ඉල්ලීම වෙනුවෙන් ස්ථිර බලපත්‍රයක් ලබාදීමට ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර නොකරන ලද බව පෙන්වා දෙන ලදි. එය "නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමා ස්ථිර කරන ලදි." යනුවෙන් සංශෝධනය කරන ලදි.

එසේම එම යෝජනාවේ ගව මස් කඩය ලෙස සඳහන් වී ඇති බැවින් ඒ පිළිබඳ නගර සභා ගරු මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා විමසන ලද අතර, එය ගව මස් කඩය නොව ගෝ ඝාතකාගාරය ලෙස සංශෝධනය කරන ලදි.

එම අවස්ථාවේ අදහස් දක්වමින් ගරු උපසභාපති වසන්ත ගුණරත්න මැතිතුමා ප්‍රකාශ කළේ දැනට ගව ඝාතනයේ පාලනය වී ඇති බවත්, නිරන්තර අධීක්ෂණයක් ඒ පිළිබඳ සිදුකරන බවත්, නීති විරෝධී අන්දමින් සතුන් මැරීමට ක්‍රියාකිරීමක් සිදුවුවහොත් නගර සභාව මගින් එම බලපත්‍රය නැවත අහෝසි කිරීමට ක්‍රියාකළ යුතු බවත්ය.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

එහිදී අදහස් දක්වමින් ගරු සභාපතිතුමා විසින් සුදර්ශන ගම පාරට තාර දමා සකස් කර ඇති බව ද පල්ලෙකුඹුර පාර පැතිබැම්ම සකස් කර ඇති බවද, විදුලි කණු අංක කිරීම සිදුකර ඇත බව ද, සඳුන්ගම පාර තාර දමා සකස් කර ඇති බව ද, බුලත්ගම දෙමළ විද්‍යාලය පාර ප්‍රිමික්ස් දමා ඇති බව ද, සිටිගාර්ඩ්න් පාර හා චෙට්නෝල් පාර ශුද්ධ පවිත්‍ර කර ඇති අතර සිටිගාර්ඩ්න් පාරට මේ වන විට ද තාර දමා අවසන් වෙමින් පවතින බව ද, දන්වා සිටින ලදි.

බළන්ගොඩ, කාර්පාර්ක් අංක 05 දරණ කඩ කාමරය ටෙන්ඩර් ඉල්ලුම් කළ මුදලට පවත්වාගෙන යාමට නොහැකි බැවින් එය නැවත පවරා ගැනීමට නුවන් දේශාන් ගුණතුංග මහත්මා කර තිබූ ඉල්ලීමට අනුව පසුගිය මාසවල හිඟ මුදල් අයකර නැවත අය කර ගත්තේ දැයි නගර සභා ගරු මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා විමසා සිටි අවස්ථාවේ තැන්පත් කර තිබූ ඇප මුදලින් එම හිඟ මුදල් අයකර ගත් බව හා නැවත එය ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බවද ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

එසේම 2013 දෙසැම්බර් මස ඇල්ලෙපොල කුමාරගම මාර්ගයට ඉල්ලන ලද වීථිපහන් දෙක ලබාගැනීම මහා සභාවෙන් අනුමත කරනු ලැබුවත්, ඒ වන විට පැවති කාලගුණික තත්ත්වය නිසා ගරු සභාපතිතුමන් එය මදකට ප්‍රමාද කල බවත්, නැවත එම වීථිපහන් ලබාදෙන ලෙසත් නගර සභා ගරු මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා ඉල්ලා සිටින ලදි. ගරු සභාපතිතුමන් විසින් ඒ සඳහා එකඟත්වය ලබාදෙන ලදි.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 නගර සභාවේ වාහන සඳහා ණය පදනම මත ඉන්ධන ලබාදීම - විවිධ සේවා සමූපාකර සමිතිය, බළන්ගොඩ

මෙතෙක් කාලයක් ඉඹුල්පේ විවිධ සේවා සමූපාකර සමිතියෙන් ඉන්ධන ලබාගත් නමුත් පසුගිය දිනවල ඉන්ධන සඳහා ජලය එකතු වීමෙන් වාහන දෙකකට අලාභහානි වූ බැවින් බළන්ගොඩ විවිධ සේවා සමූපාකාර සමිතියෙන් ඉන්ධන ලබාගැනීමට තීරණය කරන ලද අතර, එම වාහන වලට වූ අලාභය සමිතියෙන් ගෙවන ලද බැවින්, ඉන්ධන නැවත පිරිසිදු කර ඉඹුල්පේ විවිධ සේවා සමූපාකාර සමිතියෙන් ගැනීමට තීරණය කර ඇති බව පවසන ලදි. ඒ අනුව ඉල්ලා ඇති අත්තිකාරම් මුදල ගෙවීමට අවශ්‍ය නොවන බව පැහැදිලි කරන ලදි.

### 06:02 විවෘත කඩ අංක 06 ටෙන්ඩර් තීරණය දැනුම්දීම

මෙම කඩ කාමරය සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කළත්, එකම ටෙන්ඩරයක් හෝ ඉදිරිපත් නොවූ නිසා ඒ පිළිබඳව තීරණයක් ගත යුතු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරමින් මෙම කඩ කාමරය වසර ගණනාවක සිට පවත්වා ගෙන යන එම්. එල්. ආනන්ද හා කමලාවතී මැණිකේ යන අය රු. 6500.00 බැගින් මාසික කුලියට ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති බවත්, ඔවුන් ආර්ථික වශයෙන් ඉතා අපහසුතා මැද ජීවත් වන හෙයින් ඔවුන්ට මෙම කඩ කාමරය ලබා දීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒ සඳහා මහා සභාවේ එකඟතාවය පළ කරන ලදි.

### 06:03 පුස්තකාල අතුරු ව්‍යවස්ථා කෙටුම්පත සංශෝදනය කිරීම

බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා සකස් කළ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත සංශෝධන සහිතව ඉදිරිපත් කර තිබූ අතර එය අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:04 ලේඛනාගාරයේ ඉඩ පහසුකම් ලබාගැනීම

දැනට ලේඛනාගාරයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් හා මේ දිනවල ඵලදායිතා හා කාර්යසාධන තරග සඳහා සූදානම්වන බැවින් දැනට උඩුමහලේ ඉඩකඩ ඇති ස්ථානයක ලේඛනාගාරයට යොමු කරන ලිපිගොනු ගබඩා කර ගැනීම සඳහා වෙන් කර ගැනීමටත් පසුව ඒ සඳහා ස්ථිර ස්ථානයක් ලබාදීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 නො. 251/1 ඉඩමේ සැලැස්ම අනුමත කර ගැනීම - එච්. පී. ධම්මිකා මල්කාන්ති නෙල්ලම්පිටිය**

බළන්ගොඩ, බුලත්ගම නො. 251/1 ඉඩමේ සැලැස්ම අනුමත කර ගැනීමට එච්. පී. ධම්මිකා නෙල්ලම්පිටිය මහත්මිය විසින් ඉල්ලීමක් කර තිබූ අතර එම සැලැස්ම පර්චස් 5.5 ක ඉඩමක් බැවින් නගර සභාවෙන් අනුමත කර ගැනීමට නොහැකි බවත්, වෙනත් ඉඩමක් මිලදී ගැනීමට හැකියාව නොමැති බැවින්, නැවත සැලසුම් කමිටුවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට ඉදිරිපත් කර තිබූ අභියාචනය ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

එසේම ගරු උපසභාපතිතුමන් විසින් එම ඉඩමට අනුමැතිය නොදීම නිසා නිවැසියන් ඉතා අසරණ තත්ත්වයට පත්ව සිටින බවද, ඔවුන්ට වෙන ඉඩමක් හෝ වත්කමක් නොමැති බැංකු ණය ආදියට ඔවුන් නොයන බවද, ඔවුන්ගේ අභියාචනාව සලකා බලා ඉඩම අනුමත කරලීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදි.

**06:06 බළන්ගොඩ දොරවෙල පාලම අසල කහ ඉර ඉවත්කර ගැනීම - සුදත් ප්‍රියන්ත, යශෝධා හාඩ්වෙයාර්**

බළන්ගොඩ, දොරවෙල පාලම අසල කඩපෙළ ඉදිරිපිට පාලම දක්වා අඩි 08 ක් දිගට කහඉරක් යොදා ඇති අතර එම කඩපෙළ ඉදිරිපිට වාහන නවතා තැබීමට ඇති තදබදය අවම කර ගැනීම සඳහා යශෝධා හාඩ්වෙයාර් අධිපති සුදත් ප්‍රියන්ත මහතා කර තිබූ ඉල්ලීම අනුව වෙළඳ ව්‍යාපාරිකයන්ට අසාධාරණයක් නොවන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කර එම කහඉර වෙනස් කිරීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 වැකුඹුර, කනත්ත මාර්ගයේ ආරක්ෂිත බැම්ම වැසී ඇති අතර එය නැවත සකස් කර දෙන ලෙස ඉල්ලිම - එම්. එම්. නිහාල් විමලසිරි**

බළන්ගොඩ, කනත්ත මාර්ගය සකස් කිරීමේදී වැසි ජලය එම්. එම්. නිහාල් විමලසිරි මහතාගේ නිවසට ගලාගෙන එන බැවින් එය සකස් කර දෙන ලෙස ඒ මහතා කළ ඉල්ලීම අනුව සභාව මගින් පැති බැම්ම සකස් කර දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය. එසේම ඒ පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස වැඩඅධිකාරීට දන්වන ලදි.

**06:08 2014 මිහිඳු පෙරහැර සඳහා අනුග්‍රහය ලබාගැනීම - බළන්ගොඩ එක්සත් බෞද්ධ සංගමය**

මෙවර බළන්ගොඩ නගරයේ පැවැත්වෙන මිහිඳු පෙරහැර සඳහා අනුග්‍රහයක් ඉල්ලා බළන්ගොඩ එක්සත් බෞද්ධ සංගමය කර තිබූ ඉල්ලීම අනුව රු. 25000.00 ක මුදලක් සභා අරමුදලෙන් ලබාදීමට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 සභාවට නොපැමිණෙන බව දැනුම්දීම - ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා**

නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා අසනීප බැවින් සභාවාරයට පැමිණිය නොහැකි බැවින් නිවාඩු අනුමත කර දෙන ලෙස කර තිබූ ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 බළන්ගොඩ පොදු වෙළඳසැලේ පැවැත්වෙන පොසොන් බත් දන්සැල සඳහා අවශ්‍ය පහසුකම් සලසා ගැනීම - බළන්ගොඩ සමාජ සේවා පදනම**

බළන්ගොඩ පොදු වෙළඳසැලේ පැවැත්වෙන පොසොන් බත් දන්සැල සඳහා පොදු වෙළඳසැල තීන්ත ආලේප කර සෝදා පිරිසිදු කර ගැනීමට ද, පානීය ජලය ලබාගැනීමට ජල බවුසරය ද, දන්සැල සඳහා අවශ්‍ය පුටු 130ක් ද, හට් 02 ක් ද ඉල්ලා බළන්ගොඩ සමාජ සේවා පදනම විසින් කර තිබූ ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 බළන්ගොඩ, මිරිස්වත්ත සුබයිර් අලීම් මාවත වැඩ අවසන් කිරීමට මුදල් ලබැගැනීම - ප්‍රදේශවාසීන්**

බළන්ගොඩ, මිරිස්වත්ත සුබයිර් අලීම් මාවත අවසන් කොටස වැඩ නිම කර ගැනීමට අවශ්‍ය රු. 25000.00 ක මුදලක් ඉල්ලා එම ප්‍රදේශවාසීන් කර තිබූ ඉල්ලීමට අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

සභා යෝජනා අංක **12:01** යටතේ සම්මත කරනු ලබන මුදල් කාරක සභා වාර්තාවට රු. 10,000.00 ට වැඩි ගෙවීම් ඇතුළත් වේ.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

සභා යෝජනා 12:01 යටතේ සම්මත කරනු ලබන මුදල් කාරක සභා වාර්තාවට ඇස්තමේන්තු අනුමත කිරීම ඇතුළත් වේ.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

මෙවර සභාවාරය සඳහා ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි

## 11. යෝජනා

### 11:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා

11:01:01 පරිසර බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය වන්නේ කුමන් ආයතන සඳහා ද යන්න පැහැදිලි කරගැනීම

එම යෝජනාවන් ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, මෙම යෝජනාව අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට එම ආයතන පිළිබඳ සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කිරීමට පවරන ලදි.

11:01:02 නගර සීමාව තුළ ඇති රසායනාගාර වලට පරිසර බලපත්‍රය අවශ්‍ය වන්නේ ද යන්න පැහැදිලි කරගැනීම

එම යෝජනාවන් ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙම අවස්ථාවේදී ඉහත කරුණු සම්බන්ධව ප්‍රකාශයක් ලබාගැනීමට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට ඉඩ ලබාදීම සඳහා ගරු සභාපතිතුමා මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදි.

***මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා***

*ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමාගේ යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් නගර සභා සීමාව තුළ විවිධ ආයතන වර්ග 25 කට පමණ බලපත්‍ර ලබා දෙන නමුත් රසායනාගාර සහ ඔසුසැල් සඳහා රජයේ අනුමැතිය පමණක් අවශ්‍ය වන බවද ප්‍රකාශ කරන ලදි.*

***ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා***

*රසායනාගාර සඳහා මැදිහත් නොවීම නිසා විෂමාචාර රැසක් මතුවී ඇති බව ද ඖෂධ වල ප්‍රමිතිය පිළිබඳ නූතනයේ ගැටළු රැසක් උද්ගත වී ඇති බවද පෙන්වා දෙන ලදි. එසේම රසායනාගාර සඳහා නගර සභාවෙන් බලපත්‍රයක් නොදෙන බැවින් ඔවුන්ට අවශ්‍ය ආකාරයට එම ආයතන පවත්වාගෙන යන බව ද, හිතුමනාපයට ඔවුන් කටයුතු කරන බවද, ඖෂධ පිළිබඳ නොදන්නා පුද්ගලයන් ඒවා නිකුත් කරන බවද, එසේ බලපත්‍රයක් ලබාදීමට කටයුතු කළ හැකිනම් නගර සභාවට ආදායමක් ලැබෙන බව ද, එතුලින් විධිමත් රසායනාගාර හා ඔසුසැල් සේවාවක් සඳහා මැදිහත්වීමක් කළහැකි බවද පසුබිම සැකසිය හැකි බව ද පෙන්වා දෙන ලදි.*

***ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා***

*නගර සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළ හැකි ආයතන වර්ග 25ක් ඇති නමුත් රසායනාගාර හා ඔසුසැල් සඳහා නගර සභාවෙන් වෙළඳ බලපත්‍රයක් පමණක් ලබාදෙනු ලබයි. පරිසර බලපත්‍රය මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත යුතුයි. එබැනින් රසායනාගාර හා ඔසුසැල් සඳහා අපට මැදිහත් විය නොහැකිය.*

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා***

*ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් කීපයක් ප්‍රකාශ කළ යුතුයි. මෙම යෝජනාව කාලෝචිත යෝජනාවකි. බළන්ගොඩ නගරයේ විවිධාකාරයේ රසායනාගාර සේවාවන් දක්නට ලැබේ. එසේම නොයෙක් තත්ත්වයේ වෛද්‍යවරු සිටිති. නගරයට පිටස්තර ප්‍රදේශ වලින් ඉතා විශාල පිරිසක් රසායනාගාර සේවාවන් ලබාගැනීමට පැමිණෙති. එයට හේතුව මූලික රෝහලේ එතරම් විශාල පිරිසකට රසායනාගාර සේවාවන් සැපයීමට පහසුකම් නොතිබීමයි. නගරයේ ජීවත් වන හා නගරයට පැමිණෙන ජනතාවගේ සුවසෙත සෞඛ්‍යාරක්ෂිත භාවය වෙනුවෙන් නගර සභාව බැඳී සිටින බැවින් හා රසායනාගාර අයිතිකාරුවන් විශාල ආදායමක් ලබන බැවින් අතිවිශාල පිරිසකගේ යහපත ආරක්ෂාව සඳහා සහ නගර සභාවට ආදායමක් ලබාගැනිමට සඳහා ගරු සභාපතිතුමා මූලික වී යම් වැඩපිළිවෙලක් සැකසීම සුදුසු බවට මම යෝජනා කරමි.*

***නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා***

*ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමාගේ යෝජනාව හා නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා අදහස් පල කිරීම සම්බන්ධව මම එකඟ වෙමි. රසායනාගාර හා ඔසුසැල් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා මැදිහත් වීමේ යෝජනාව සමගම සියලුම ඔසුසැල්වල ඖෂධවේදීයෙක් සිටීම අනිවාර්ය විය යුතුයි. නගර සභාව විසින් හෝ සියලුම ඔසුසැල් හිමියන් කැඳවා දැනුවත් කිරීමක් සිදුකිරීම කළ යුතුයි. බළන්ගොඩ ජනතාව ආරක්ෂා කිරීම අපගේ යුතුකමයි.*

***නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂ මැතිතුමා***

*බළන්ගොඩ ප්‍රදේශයට ඔසුසැලක් ආරම්භ කිරීම සඳහා රජයේ ඔසුසැලට ඉල්ලීමක් කිරීමට මීට පෙරත් සභාවට යෝජනාවක් ඉදිරිපත් කළ නමුත් එහි නීතිමය ගැටළු ඇති වේ. නමුත් බළන්ගොඩ ප්‍රධාන නගරයක් බැවින් නැවත එම යෝජනාව පිළිබඳ සලකා බැලීම සුදුසුයි.*

***මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා***

*දැනට ඔසුසැල් සඳහා වෙළඳ බලපත්‍ර ලබාදීමේදී සලකනු ලබන්නේ ඖෂධ අධිකාරියේ බලපත්‍රය තිබේනම වෙළඳ බලපත්‍රය නගර සභාව විසින් නිකුත් කරනු ලැබීමයි. රසායනාගාර සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය යටතේ රසායනාගාර සම්බන්ධව ඇති බලපත්‍රය තිබීම ප්‍රමාණයත් වේ. සභාවේ සම්මත වූ මෙම යෝජනාව සම්බන්ධයෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ නියෝජිතයා ලෙස තෝරාගෙන ඇති පළාත් සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ දැනුවත් කර මේ සම්බන්ධයෙන් ලිඛිත පිළිතුරක් බලාපොරොත්තු වීම සුදුසුය. එසේම ඖෂධවේදීන්ගේ හිගය නිසා සෑම ඔසුසැලකම ඖෂධවේදියෙක් නොමැතිවීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයකට යාමට හැකියාවක් නොමැත. නමුත් ඒ සඳහා දඩ මුදලක් අයකර ගනු ලබයි. එසේම රසායනාගාර සේවාවන් සඳහා සිටින නිලධාරීන්ගේ පුහුණුව සම්බන්ධව වෙළඳ බලපත්‍රය ලබාදීමේදී සලකා බැලීමක් කළ හැකිය.*

*මෙම කරුණ පිළිබඳව නගර සභාව මැදිහත් විය යුතු බවද, අවශ්‍ය බලධාරීන් දැනුවත් කිරීමට ද තීරණය විය.*

**11ඃ02 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

11ඃ02ඃ01 රණවිරු ස්මාරකයක් තැනීම සඳහා ස්ථානයක් ලබා ගැනීම

රණවිරු ස්මාරකයක් තැනීම සඳහා ස්ථානයක් ලබා ගැනීමට කර තිබූ යෝජනාවට අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, ඒ සම්බන්ධව පහත සඳහන් අදහස් ඉදිරිපත් විය.

***නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*මෙම ඉල්ලීම බළන්ගොඩ රණවිරු සංසදයේ ඉල්ලීමකි. රණවිරු ස්මාරකය සඳහා තුරු වියන හෝ ගල්වල අසල ඉඩකඩක් දෙන්නේ නම ඉතා සුදුසුයි.*

***ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා***

*තුරු උයන අසල ඉඩම මීට පෙරද ලබාගැනීමට අවසර දුන්නත්, බළන්ගොඩ රණවිරු සංසදය වටරවුම් ඉඩකඩ ඉල්ලා සිටී. නමුත් මාර්ග අවහිර වන බැවින් එවැනි ස්ථානයක් ලබාදිය නොහැකි වුවත් තුරු වියන හෝ ගල්වල අසල ඉඩකඩක් ලබාදීමට හැකියි. නැතිනම් දොරවෙල ජල ටැංකිය අසල ඉඩක් හෝ ලබාදිය හැකියි.*

**11ඃ03 නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමාගේ යෝජනා**

11ඃ03ඃ01 බළන්ගොඩ, අනදමෙත්ගම නිවාස යෝජනා ක්‍රමයේ මැදපාර සංවර්ධනය කිරීම සඳහා 2014 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රු. 250,000.00 ලබාගැනීම

බළන්ගොඩ, අනදමෙත්ගම නිවාස යෝජනා ක්‍රමයේ මැදපාර සංවර්ධනය කිරීම සඳහා 2014 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රු. 250,000.00 ලබාගැනීම සඳහා නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා කර තිබූ යෝජනාවට අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

මෙම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:04 නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂ මැතිතුමා**

11:04:01 ෆලීල් හජියාර් මාවත කඩිනමින් සංවර්ධනය කිරීම

11:04:02 මිරිස්වත්ත අලාබ්දීන් මාවත ප්‍රතිසංස්කරණය කිරීම හා ශුද්ධ පවිත්‍රකර ගැනීම

නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂ මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ඉහත යෝජනාවන්ට අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

මෙම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

**12:01 මුදල් කාරක සභා වාර්තාව**

2014.05.21 වන දින පැවති මුදල් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:02 කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව**

2014.05.21 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:03 සෞඛ්‍ය, සන අපද්‍රව්‍ය හා උපදේශන කාරක සභා වාර්තාව**

2014.05.19 වන දින පැවති සෞඛ්‍ය, සන අපද්‍රව්‍ය හා උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:04 තානායම් කමිටු වාර්තාව**

2014.05.21 වන දින පැවති තානායම් කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඒ සඳහා ඉදිරිපත් වූ අතර එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා***

*ඉදිරියේ දී නගරය සංවර්ධනය වීමේදී නගර සභා මහජන ක්‍රීඩාංගනය විශාල වන්නේදැයි සහ එම විශාල වීමේදී නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන්ගේ ප්‍රතිපාදන වලින් ගොඩනගමින් පවතින ළමා උද්‍යානයට ගැටළුවක් ඇතිවනවාදැයි නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් විමසා සිටින ලදි. ජනතා ධනය විනාශ නොවන ලෙස කටයුතු කළ යුතු බව එතුමන් විසින් පෙන්වා දෙන ලදි. එසේම ළමා උද්‍යානය අසල වැසිකිළි පද්ධතියක් සැකසීමේ දී ජංගම වැසිකිළි පද්ධතියක් ස්ථාපිත කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.*

*එසේම තානායම යම් යම් මාසවල ලාභ ලැබුවත් විශාල මුදලකින් පාඩු සිදුවීම බහුල බවත්, සුළු ලාභයක් ලැබූ විට එම පාඩු ගැන තැකීමක් නොකරන බවත්, තානායම් සේවකයන් සඳහා ලබාදෙන දීමනාව වැඩිකළ අතර මෙවැනි අලාභ පාඩු සිදුවීමේ දී තානායම නඩත්තු වන්නේ සභාවේ අරමුදලින් බවත් මහජනයාට ප්‍රතිලාභ සැලසිය හැකි නගර සභා ප්‍රතිපාදන වලින් පාඩු පියවීමට සිදුවන බවත්, එබැවින් මේ සඳහා දීර්ඝ කාලීන විසඳුමක් සඳහා තීන්දු තීරණ ගතයුතු බව ද නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. ගරු සභාපතිතුමා හෝ අදාළ නිලධාරීන් අපහසුතාවයට පත්කිරීමේ අදහසකින් මෙය ප්‍රකාශ නොකරන බවත්, අනෙක් මන්ත්‍රීවරුන්ගේ අවධාණය පිණිස මෙම අදහස් ප්‍රකාශ කළ බවත් එතුමන් විසින් දන්වන ලදි.*

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

13:01 2014 අප්‍රේල් මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 5,488,176.45 |
| වෙනත් ලැබීම් | 769,069.20 |
| **මුළු ලැබීම්** | **6,257,245.65** |
| පුනරාවර්තන වියදම් | 5,854,991.27 |
| වෙනත් වියදම් | 1,972,110.72 |
| **මුළු වියදම්** | **7,827,102.29** |

ඉහත වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, පහත සඳහන් අදහස් ඒ සඳහා ඉදිරිපත් නොවුණි.

**13:02 2014.02.01 සිට 2014.02.28 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2014.04.01 සිට 2014.04.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 357,591.15 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු

**14:01 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

මෙම දිනවල ඩෙංගු රෝගය සීඝ්‍රයෙන් බෝවීමෙන යන බවද එය පාලනය කිරිම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන නමුත් නගරයේ පිටුපස ඇති කාණු පද්ධති පිරිසිදු කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ කිරීම යහපත් බව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ගරු සභාවට යෝජනා කරන ලදි. දිනයක් නියම කර කඩහිමියන් ද දැනුවත් කර නගරයේ ඇති කාණු පද්ධතිය ජල බවුසරය උපයෝගී කරගෙන පවිත්‍ර කිරීම සුදුසු බව ද නගරය තුළ සොල්ෆැක්ස් ඉසීම කළ යුතු බවද එතුමන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. එසේම ජනතාව දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා බෙදාදීම හා නොදිරන දේ දැමීමට කවර සපයා දිමට කටයුතු කරන ලෙස එතුමා ඉල්ලා සිටින ලදි.

ලංකාදීප පුවත්පතේ සඳහන් සිනමා ශාලාවක් ඇති කිරීම සම්බන්ධ ප්‍රවෘත්තියේ දී කිසිම සිනමා ශාලාවක් නමින් සඳහන් නොකළ බවද, සිනමා ශාලා දෙකෙන් එකක් විවෘත කර ගැනීමට හැකිනම යහපත් බවත්, සිනමා ශාලාවල භූමිය පිළිබඳ අයිතියක් ප්‍රකාශ නොකළ බවද, රජය සතු ඉඩමක් බවට තමා ප්‍රකාශ කළ බව පුවත්පතේ පළවී ඇතිබව ද නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් පෙන්වා දෙන ලදි. සිලෝන් නම් සමාගමට අයත් ඉඩමක් ඉම්පීරියල් සිනමාහල සඳහා මිලදී ගෙන ඇති බවත් එම ප්‍රවෘත්තිය නිවැරදි කර පුවත්පතේ පළ කරන ලෙස ගරු මන්ත්‍රීතුමන් විසින් ඉල්ලා සිටින ලදි.

“හොඳම දේ දරුවන්ට” යන තේමා පාඨය ළමා උද්‍යානයට ගෙන ඇති බවද, එය තේරුම් ගෙන සම්පූර්ණ සහයෝගය ලබාදීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තූතිය පළ කරන බව ද, රජය විසින් යෝජනා කරන ක්‍රීඩා සංකීර්ණයක් බළන්ගොඩට අවශ්‍ය බවද ඒ සඳහා නගර සීමාවේ ඉඩක් නොමැති බවද, එය නගරය මැදින් පසෙකොට හෝ නගරයෙන් පිටතට ගමන් කළ හැකි බවද, අනාගත බාල පරපුර වෙනුවෙන් කරන මෙහෙයක් ලෙස මෙම ළමා උද්‍යානය නිර්මාණය වන බවද, නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩමක් වෙන්වී ඇති නමුත් නගර සංවර්ධනය වීමේ දී එම ප්‍රදේශය යාහැකි නමුත් දැනට එම ප්‍රදේශය දරුවන් සඳහා යෝග්‍ය නොවන බවද, කිසිවෙකුට හෝ අවහිරයක් නොවන ලෙස එය ගොඩනගන බවද නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. එසේම ගරු සභාපතිතුමාගේ මූලිකත්වයෙන් එම ළමා උද්‍යානය තුළ දරුවන්ගේ යහපත් ආකල්ප වර්ධනය කිරීමෙ වැඩසටහන් සංවිධානය කරන බවද ගරු මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලදි.

එසේම නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා තානායම පිළිබඳ අවධානයක් නොමැති බව ප්‍රකාශ කළත් එය නගර සභාවෙන් කිරීම සම්බන්ධයෙන් මුලින් ම විරුද්ධ වූයේ තමන් බවත්, ඒ පිළිබඳ ප්‍රකාශයක් නොකරන බවත් නූතනය වන විට තානායම නගර සභාවට සම්පතක් වී ඇති බවත්, ව්‍යාපාරවලදී ලාභ අලාභ දෙකම සිදුවිය හැකි නමුත් තවත් ඉදිරියට එය පාඩු නොවී කරන ක්‍රමවේදයන් පිළිබඳ අවධානය යොමු

කළ යුතු බවද තානායමේ කාමර ලබාදීමේ දී ඒ පිළිබඳ විස්තර තානායම් කමිටු වාර්තාව සමග ලැබීමට සලස්වන ලෙසද ප්‍රකාශ කරන ලදි.

**14:02 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

සුබයිර් අලීම් මාවත දෙවන පටුමග මාර්ගය සකසා දීම සඳහා ඉතිරි මුදල ලබාදීම සම්බන්ධයෙන් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ගරු සභාපතිතුමාට හා ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිය ප්‍රකාශ කරන බව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

එසේම ලංකාවේ සෙසු ප්‍රදේශ වල සීඝ්‍රයෙන් ඩෙංගු රෝගය පැතිර යන බැවින් බළන්ගොඩ ප්‍රදේශය පිළිබඳ ගරු සභාපතිතුමාගේ මූලිකත්වයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් විවිධ ව්‍යාපෘති සිදුකරන අතර එය ඉදිරියටද සාර්ථක ලෙස සිදුකරන ලෙස එතුමන් විසින් ඉල්ලා සිටින ලදි.

එසේම තානායම පාඩු සම්බන්ධව සාකච්ඡා වූ අතර ව්‍යාපාර සම්බන්ධ පළපුරුද්ද ඇති ගරු ධර්මසේන සමරසිංහ මැතිතුමා කළ ප්‍රකාශය නිවැරදි බවත්, යම් යම් කාලවල ව්‍යාපාර ලාභවිය හැකි සේම පාඩු සිදුවන බවද මුල් කාලයේ පාඩු ලැබුවත් දීර්ඝ කාලයට සිට එය ලාභ ලබන ආයතනයක් බැවින් එය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු බවද ප්‍රකාශ කර සිටින ලදි.

එසේම රිසාලා සමාජ සුභසාධන සංගමයට ප්‍රදානය කරන ලද මල්ටි මීඩියා ප්‍රජෙක්ටර් යන්ත්‍රය වෙනුවෙන් හා එය ප්‍රදානය කිරීමේ උත්සවයට සහභාගි වී නගර සභාව හරහා වන සංවර්ධනය, නගර සභාව හා ජනතාව ඇති සම්බන්ධතාවය හා නගර සභාව තුළ ජාති ආගම් භේද නොමැතිව සියලු දෙනාට සමානව සේවය සලසන ආයතනයක් බවට දැනුවත් කිරීම පිළිබඳව ගරු සභාපතිතුමාට නැවත වතාවක් ස්තුතිය පළ කරන බවද නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

ලබන ජූලි මාසය නෝම්බි මාසය බැවින් දැනට ක්‍රියාත්මක වීදිලාම්පු වල අක්‍රීය වූ තැන් පමණක් අලුත්වැඩියා කර දෙන ලෙසද, බළන්ගොඩට විශාල සංවර්ධනයක් කළ හිටපු ආණ්ඩුකාර දිවංගත මොහාන් සාලිය එල්ලාවල මැතිතුමාගේ 05 වන ගුණසමරුව පසුගිය සතියේ පැවති බවත් ප්‍රදේශය සංවර්ධනය කළ පළාත් පාලන නායකයෙකු වශයෙන් මහජන නියෝජිතයන්ගේ ගැටළු විසඳූ නායකයෙකු වශයෙන් සිහිපත් කළ යුතු බවද, රට වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් වෙනුවෙන් ධර්මසේන සමරසිංහ මැතිතුමා යෝජනා කළ රණවිරු ස්මාරකය ඉදිකිරීමට තුරු උයන ලබා දීම සුදුසු බව ද කුමාරගම පිරිවෙන මාර්ගය අබලන් වී ඇති බවත් ඒ සඳහා ලක්ෂ 18 ක් වෙන් කර ගැනීමට ගරු සභපතිතුමන් විසින් කළ මෙහෙයට විශේෂ ස්තුතිය පළ කරන බවද මුස්ලිම් ජනතාව වැඩි වශයෙන් ජීවත් වන ප්‍රදේශයෙන් එළඹෙන මැතිවරණයට ඉදිරිපත් වන බවද ඉදිරියටත් ජනතාවට සේවය කරන බව ද එතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

**14:03 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

තමන් විසින් ඇල්ලෙපොල ප්‍රදේශය වෙනුවෙන් ගෙනෙන ලද යෝජනා ඉතා කඩිනමින් ගරු සභාපතිතුමන් විසින් ඉටුකර දී ඇති බවත්, මහමෙව්නාව පාර, පල්ලෙකුඹුර පාර, සරස්වතී පාර දෙවැනි තාර වඩි දමන ලෙස ඉල්ලා සිටින අතර සුසාන භූමිය සැකසීමට කටයුතු කිරීම වෙනුවෙන් ද, 2014 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලැබෙන රු. 250,000.00 ක මුදලින් එක් පවුලකට රු. 14000.00 ක වටිනාකමකින් යුක්ත ඇස්බැස්ටස් තහඩු දිළිඳු පවුල් 20ක් සඳහා ලබාදීමට ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරුන් හා නිලධාරී මණ්ඩලය කටයුතු කිරීම වෙනුවෙන් ද ස්තුතිය පල කරන ලදි. එම ඇස්බැස්ටස් තහඩු බෙදාදීම අද දින සිදුවන බැවින් ඒ සඳහා සහභාගි වන ලෙස ඉල්ලි සිටි ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා හා එම පවුලේ අය විසින් අද දින අති ගෞරවනීය ආනන්ද මෛත්‍රිය නාහිමියන්ගේ මැණියන් පිරිමි දරුවෙක් ලැබේවා යයි භාරහාර වූ බෝ වෘක්ෂය සඟ සතු කොට පූජා කිරීම

සම්බන්ධයෙන් සියලුදෙනාගේම ස්තූතිය පළ කරන බවද ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා ඉල්ලූ රණවිරු ස්මාරකය සඳහා ස්ථානයක් ගරු සභාපතිතුමන්ගේ මූලිකත්වයෙන් ලබාදීම තුළින් අනෙකුත් පළාත් පාලන ආයතන වල සභාපතිවරුන්ගේ අවධානය යොමු වනු ඇති බව ද රට බේරාගත් රණවිරුවන්ට උපහාර පැවැත්වීමට ජනතාවට කටයුතු සැලසිය යුතු බවද පෙන්වා දෙන ලදි.

**14:04 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් එක් ගමකට එක් වැඩක් යනුවෙන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන අතර ඉතා විශාල මුදලක් බලන්ගොඩ ආසනයට ලැබී ඇති අතර එය ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සිදුවන නමුත් දෙවන අදියර හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති නගර සභාව මගින් ක්‍රියාත්මක කිරීමට ලබාගන්නා ලෙස ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් යෝජනා කරන ලදි. නැතිනම් දේශපාලන වශයෙන් බොහෝ අවාසි සිදුවන බවද නගර සභාවෙන් සිදු කිරීමෙන් ගැටළු බොහෝමයක් අවම කරගත හැකි බවද එතුමන් විසින් පෙන්වා දෙන ලදි.

එසේම බුලත්ගම වීරසුන්දරාරාම මාවත දෙවන තාර වඩිය දමා වැඩ අවසන් කර දෙන ලෙස ඉල්ලා සිටි අතර 2014 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලැබුණ මුදලින් රු. 70,000.00 ක් වැයකර වැවේවත්ත කාණුවක් සෑදූ අතර කාණුව වැඩ අවසන් කළ ස්ථානයේ ජලය පිරෙන බැවින් වතු අධිකාරී දැනුවත් කර එම ස්ථානය සකසා දෙන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂක හරහා උපදෙස් ලබාදෙන ලෙස ගරු සභාපතිතුමන්ගෙන් එතුමා වැඩි දුරටත් ඉල්ලා සිටින ලදි.

එසේම ෆයිරූස් හාඩ්වෙයාර් අසලින් යන මාර්ගය සඳහා එහි හිමිකරු මුදල් ලබාදෙන අතර ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස ද ඉල්ලා සිටි අතර ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා ප්‍රකාශ කළ ආකාරයට තානායම සම්බන්ධයෙන් ආරම්භයේ දී විරුද්ධ වූයේ කිසියම් හේතුවක් මත බව ද මැතිවරණයකට යාමේ දී සිදුවන අවාසිය සලකා එලෙස විරුද්ධ වූ බවද නමුත් තානායමෙන් සේවාවක් සිදුවන බවද නගර සභාවට පැමිණෙන ඇමතිවරයෙක් මන්ත්‍රීවරයෙක් පිළිගැනීමට, රැස්වීමක් පැවැත්වීමට වැනි නොයෙක් අවශ්‍යතා සඳහා එම ස්ථානය උපකාරී වූ බවද යමෙකුට එහි අවාසිදායක තත්ත්වයක් පෙන්නුම් කළද සභාවක් ලෙස එහි වාසි බොහෝමක් ඇති බව ද ගැටළු ඇතොත් තානායම් කමිටුව හරහා සාකච්ඡා කොට ගැටළු විසඳා එය තව තවත් දියුණු කිරීමට කටයුතු කළ යුතුයැයි ප්‍රකාශ කරන ලදි.

හැකි උපරිම මට්ටමෙන් ජනතාවට සේවය කර ඇති අතර ඉදිරිපත් වන සියළුම තරග වලින් නගර සභාව ජයග්‍රහයණය කර ඇති බවත් ඉදිරියේ පැවැත්වෙන ඵලදායීතා තරගයෙන් ජයග්‍රහයණය ලබන බවද ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන බවද තරග ජයග්‍රහණයට අවශ්‍ය ශක්තිය ධෛර්ය සැමට ලැබේවායයි ද ප්‍රාර්ථනා කළ ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් එක් ගමකට එක් වැඩක් වැඩසටහන් නගර සභාව මගින් සිදු කිරීමට නැවත සලකා බලන ලෙස ඉල්ලා සිටින ලදි.

**14:05 නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂ මැතිතුමා**

ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා යෝජනා කළ රණවිරු ස්මාරකය සඳහා බයිපාස් මාර්ගයේ බස්නැවතුම් පොළ අසල ත්‍රීවිල් නැවතුම ඉඩම සුදුසු බවට යෝජනා කරන ලදි. එසේම 2014 අයවැය යටතේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරයෙක් විරුද්ධ වුවද, ගරු සභාපතිතුමන් හා අනෙකුත් මන්ත්‍රීවරුන් සංවර්ධන කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සියළුම මන්ත්‍රීවරුන්ට ලබාදීමට සහයෝගය පළකල බවද ඒ සඳහා ස්තූතිය ප්‍රකාශ කරන බවද දන්වන ලදි.

## 15. අවසානය

**ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා විසින් විමසන ලද බළන්ගොඩ නගර සංවර්ධනය වීමේදී මහජන ක්‍රීඩාංගනය විශාල කිරීම පිළිබඳ මෙතෙක් තීරණයක් ගෙන නොමැති බවත් අංගසම්පූර්ණ ළමා උද්‍යානයක් සෑදීම පිළිබඳ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ඇතත් ඒවා ක්‍රියාත්මක වන තෙක් දැනට ඇති ප්‍රතිපාදන වලින් ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා ඉදිකරන්නට යෙදුන ළමා උද්‍යානය යොදා ගන්නා බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. නමුත් ක්‍රීඩා පිටිය විශාල කිරීමේදී ළමා උද්‍යානයට හානියක් නොවන ලෙස කටයුතු කරන බවද එතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

එසේම තානායම පාඩු ලබන්නේ සමස්තයක් ලෙස ගත් කළ අප්‍රේල් මාසයේ පමණක් වන බව ද වසරේ අනෙක් මාසවල විශාල ලාභයක් එතුළින් උපයන බවද, සෑම වසරකම මේ තත්ත්වය පවතින බවද පෙන්වා දෙන ලදි.

ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ගෙන ආ එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘතියේ ඊළග අදියරේ ව්‍යාපෘති නගර සභාව මගින් සිදුකළ නොහැකි බවත් දිනපතා සිදුකළ යුතු නඩත්තු හා ලැබෙන වෙනත් මුදල් වලින් කලයුතු සංවර්ධන කටයුතු හා වෙනත් බොහෝ හේතූන් නිසා සියල්ල කිරිම අපහසු බවද නමුත් සියළු සංවර්ධන කාර්යයන් අධීක්ෂණය කිරීම අප විසින් කළ යුතු බව ද ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදි.

ගරු උපසභාපති ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් රසායනාගාර හා ඔමුසැල් පිළිබඳ විමසන ලද අතර දැනට හෝටල් සම්බන්ධයෙන් වර්ගීකරණයක් කරගෙන යන බවද නෙස්ලේ සමාගම සමග එක්ව හෝටල් හිමියන් දැනුවත් කර ශ්‍රේණීවලට වෙන්කිරීමක් සිදුකරන බවද ඒතුළින් යම් ප්‍රමිතියකින් යුතු හෝටල් ජාලාවක් බළන්ගොඩ ඇති කරන බවද ඉදිරියේ දී රසායනාගාර හා ඔසුසැල් සඳහා පවතින නීතිමය ප්‍රතිපාදන තුළ යම් ක්‍රියාමාර්ගයක් ගන්නා බවද මේ සියලුම දේවල් තුළින් ජනතාව වෙත යහපත් සේවාවක් සැලසීම සඳහා කටයුතු කරන බවද ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ කටයුතු ප. ව. 12.30ට අවසන් කරන ලදී

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.